# උපෝසථ දිනය හා උපෝසථ වත පිළිබඳ විමසුමක්

**- කිරිමැටියාවේ ධම්මසිරි හිමි**

## 1. හැඳින්වීම

භාරතීය සමාජ ඉතිහාසය පරීක්ෂා කරන විට පෙනීයන සුවිශේෂී ලක්ෂණයක් නම් මිනිසාගේ උපතේ සිට මරණය දක්වා දිනය වේලාව ඉතා වැදගත් කොට සැලකීමය. විටෙක එය මිනිස් ජීවිතයට පමණක් සීමා නොවී ආගමික සංස්ථාවන්ට පවා බලපෑමක් එල්ල කොට ඇත. ඒ අනුව බ්‍රාහ්මණ සමාජයේ ස්වකීය ආගමික කෘත්‍යයන් සඳහා වෙන් කොට ගත් දිනය උපොසථ/උපවසථ දිනය නම් විය. මෙහි නිරුක්තාර්ථය සංස්කෘත භාෂාවෙහි *upavasatha* උපවසථ යන වචනයෙන් හින්නව *uposatha* උපොසථ යන පාලි වචනය නිර්මාණය වී ඇත. සංස්කෘත වියරණ ග්‍රන්ථවලට අනුව 'උප' යන උපසර්ග පදය පෙරටුව වස් නැමති ධාතුවෙන් නිර්මාණය වූ පරස්මෛ පදයෙහි වර්තමාන කාල ප්‍රථම පුරුෂ ක්‍රියා රූපය 'උපවසති' නම් වේ. එයින් අර්ථවත් වනුයේ සමීපයේ වසයි, ජීවත්වෙයි, යන්නය.[1] උපෝසථ යන්නෙහි ප්‍රාකෘත රූපය 'උවාසද්ධ' නම් වේ. එය හීබ්‍රෑ බසින් 'සබත්' වශයෙක්ද මිශ්‍ර සිංහල බසින් 'උපොෂථ' නමින්ද ශුද්ධ සිංහල බසින් පෙහෙවස, පෝහොය, පෝ වශයෙන් දක්වා ඇත. පාලි සිංහල ශබ්දකෝෂයෙහි එහි වාග් භේදය දක්වා ඇත්තේ පෞෂථ> පොසථ> උපොසථ> පෙහෙවස> පොහොය> පෝය ලෙස ය. පණංගල ජිනරතන හිමියන්ගේ භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ වර්ණනාවෙහි දක්වා ඇති ආකාරයට උපොසථ යන්න නිර්මාණය වී ඇත්තේ



උප+√වස+අථ =උපොසථො ලෙසයි. "උප" යනන සමීපාර්ථය ද "වස" යන්න නිවාසෙ, විසිම යන අර්ථය ඇති භූවාදී ගණික ධාතු මූලයකි. ''මේ අනුව උප + වස + අථ ප්‍රත්‍යය යෙදීමෙන් හෝ 'ථො' ප්‍රත්‍යය යෙදීමෙන් හෝ උපොසථ යන්න සෑදේ. මෙයින් සමීපයට එළඹ වාසය කරත් යන අර්ථය ප්‍රධානත්වයට පැමිණේ. උපොසථ යන්නෙහි උපවාස අර්ථය ද ඇතුලත් වේ. උපවාස අර්ථය ගැනීමේ දී 'අනසනෙ උපවාසොති උපවාසො' උපොසථො' යැයි නිරුක්තිය දැක්විය හැකිය. මෙහි පද සිද්ධිය ද උප + √වස + අථ හෝ ථ හෝ ප්‍රත්‍යාන්ත වීමයි. මෙයින් ආහාර නොගැනීමෙහි එළඹ වාසය කරත් යන්න අර්ථවත් වේ''.[2] මෙලෙස බලන විට පෙනීයන්නේ විවිධ ශබ්දකෝෂ උපොසථය ලෙස පහත යෙදුම්වන උදෙසීම, ශීලයෙහි පිහිටීම, උපවාසයෙහි යෙදීම, ප්‍රඥප්ති අර්ථය, උපොසථ දිනය, සංඥා නාමය, උපොසථ කර්මය හෙවත් පොහොය කර්මය යනුවෙන් විවිධාර්ථ දක්වා ඇති බවයි. එම සියලු යෙදුම් තුළ කිසියම් සම ස්වරූපී බවක් දැකිය හැකිය.

"ඓතරේය" හා "ශතපථ" බ්‍රාහ්මණ ග්‍රන්ථ පරීක්ෂා කරන විට 'උපවසථ' යන්නෙන් අර්ථවත් වනුයේ පොහෝදිනය, සෝම යාගයට පෙර දිනය, සෝම යාගයට සූදානම්වන කාලපරිච්ඡේදය, නොවෙනස්වන ස්ථානය හා ග්‍රාමය යන අර්ථයන්ය. ගුණසේන සිංහල මහා අකාරාදිය "උපවස්" යන්නෙන් උපවාසය හා ගුණයන් රැකීම සඳහා අහාර නොගැනීම අදහස් වන බව දක්වා ඇත.[3] ඩී.ඊ. හෙට්ටිආරච්චි මහතාගේ සිංහල ශබ්ද කෝෂය උපොසථය යන්නෙන් පොහොය දවස, විශේෂයෙන් පොහොය පිරීමට නියමිත චාතුද්දසී හා පණ්ණරසී දිනයන්, පාමොක් දෙසීම, පොහොය දිනය, පොහොය දිනයේ සංඝ කර්ම කිරීම, භික්ෂූන් පොහොය කරන දවස, පෙහෙවස් සමාදන්වන දින, මෙන්ම විශේෂයෙන් තුදුස්වක හා පසළොස්වක් දින අදහස් කොට ඇත. විනය කෝෂය "උපෝසථ" යන්නෙන් සුවිශේෂී අර්ථ රාශියක් පෙළගස්වා ඇත. උපෝසථ යන්නෙන් පොහොය, පොහොය කිරීම, උපෝසථ කර්මය, චාතුද්දසී, පණ්ණරසී, සාමග්ගී, සංඝ,